


# අත්අඩංගුවට ගන්නා අවස්ථාවෙහි
# අයිතිවාසිකම්

Human Rights Commission of the Maldives
National Preventive Mechanism

# පුද්ගලයෙකු අත්අඩංගුවට ගත හැක්කේ කුමන තත්ත්වයක් තුළ ද?

## ව්‍යවස්ථාව : 46 වගන්තිය

- පුද්ගලයෙකු අත්අඩංගුවට ගත හැක්කේ:



-අත්අඩංගුවට ගන්නා නිලධාරියා විසින් වරද කරමින් තිබීම නිරීක්ෂණය කරනු ලබන්නේ නම්;

-හෝ පුද්ගලයෙකු වරදක් කර තිබෙන බවට සාධාරණ පදනමක් හෝ සාක්ෂියක් තිබෙන බවට විශ්වාස කරන්නේ නම්;

-හෝ වරදක් කරන්නට යන්නේ නම්;

-හෝ අධිකරණයක් මගින් නිකුත් කරන ලද අත්අඩංගුවට ගැනීමේ වරෙන්තුවක අධිකාරය යටතේ පමණක.

## නීති විරෝධී අත්අඩංගුවට ගැනීමක් හෝ රඳවා තබා ගැනීමක් යනු කුමක් ද?

ව්‍යවස්ථාව : 45 වගන්තිය



- සෑම කෙනෙකුටම නීතිය මගින් සලසා ඇති පරිදි මිස හිතුවක්කාර රඳවා තබා ගනු නොලැබීමේ, අත්අඩංගුවට ගනු නොලැබීමේ හෝ සිරගත කරනු නොලැබීමේ අයිතිය ඇත්තේ ය.


## ගිවිසුම් බැඳීමක් .ඉටු නොකිරීම සම්බන්ධයෙන් පුද්ගලයෙකු සිරගත කළ හැකි ද?

ව්‍යවස්ථාව : 55 වගන්තිය

- ගිවිසුම් බැඳීමක් .ඉටු නොකිරීමේ පදනම මත කිසිදු පුද්ගලයෙකු සිරගත නොකළ යුත්තේ ය.

# කිසිවෙකුට අමානුෂික ලෙස සැලකිය හැක්කේ ද?

## ව්‍යවස්ථාව : 54 වගන්තිය



- කිසිදු පුද්ගලයෙකු කෲර, අමානුෂික හෝ නින්දා ගෙන දෙන සැලකීමට හෝ දඬුවමකට හෝ වධ බන්ධනයට භාජනය නොකළ යුත්තේ ය.

## ඔබව අත්අඩංගුවට ගන්නා පුද්ගලයාට සෝදිසි කිරීමේ හෝ අත්අඩංගුවට ගැනීමේ බලය තිබේ ද?

**ව්‍යවස්ථාව : 47 වගන්තිය**



- සාධාරණ හේතුවක් ඇතොත් මිස කිසිදු පුද්ගලයෙකු සෝදිසි කිරීමට භාජනය කිරීම හෝ අත්අඩංගුවට ගැනීම නොකළ යුත්තේ යී

- පදිංචි දේපළ අනුල්ලංඝනීය විය යුතු ය, ජීවිත හෝ දේපළවලට වන හදිසි හෝ බරපතල හානියක් වැළක්වීමට හෝ අධිකරණ නියෝගයක ප්‍රකාශිත අධිකාරය යටතේ හැර පදිංචිකරුගේ කැමැත්තෙන් තොරව ඊට ඇතුල් නොවිය යුතු ය.

## මාව අත්අඩංගුවට ගනු ලැබුවහොත් හෝ රඳවා ගනු ලැබුවහොත් අත්අඩංගුවට ගැනීම හෝ රඳවා ගනු ලැබීම සම්බන්ධයෙන් මට හිමිවීමට නිසි අයිතීන් මොනවා ද?

**ව්‍යවස්ථාව : 48 වගන්තිය**



- අත්අඩංගුවට ගැනීමට හෝ රඳවා ගැනීමට හේතුව වහාම දැනුම් දෙනු ලැබීම;
- අත්අඩංගුවට ගැනීමට හෝ රඳවා ගැනීමට හේතුව යටත් පිරිසෙයින් පැය 24ක් ඇතුළත ලිඛිතව දැනුම් දීම;
- නීතිඥවරයෙකු හමුවීමට හැකි බව දැනුම් දීම;
- ප්‍රමාදයකින් තොරව නීතිඥවරයෙකුගේ සේවය ලබා ගැනීම හා උපදෙස් දීම

සහ අත්අඩංගුවට ගැනීම හෝ රඳවා ගැනීම සම්බන්ධ කාරණය නිමාවකට පත්වන තෙක් නීතිඥවරයෙකුගේ සේවය ලබා ගැනීම;

- අනන්‍යතාව තහවුරු කර ගැනීම හැර නිහඬව සිටීම හා මෙම අයිතිය පිළිබඳව දැනුවත් කරනු ලැබීම;

- චූදිතව රඳවා තබා ගැනීමේ වළංගුතාව නිශ්චය කිරීමේ, කොන්දේසි ඇතිව හෝ නැතිව නිදහස් කිරීමේ හෝ අඛණ්ඩව රැඳවුම් භාරයේ තැබීමට නියෝග කිරීමේ බලය තිබෙන විනිශ්චයකරුවෙකු හමුවට පැය විසි හතරක් ඇතුළත ඉදිරිපත් කරනු ලැබීම.

## ඔවුන්ගේ බලතල හා අධිකාරයන් පිළිබඳ පොලිස් නීතිය : 18 වගන්තිය

- අත්අඩංගුවට ගන්නා අතරතුර දී සපයනු ලැබිය යුතු තොරතුරුවලට;

  -අත්අඩංගුවට ගන්නා අවස්ථාවෙහි අත්අඩංගුවට ගනු ලැබූ තැනත්තාට ඔහුව රැගෙන යන පොලිස් ස්ථානයේ නම දැනුම් දිය යුතු ය යන්න ඇතුළත් විය යුතු ය.

## මාව අත්අඩංගුවට ගන්නා පොලිස් නිලධාරියාගෙන් ඔහුගේ අනන්‍යතාව දන්වන ලෙස මට කියා සිටිය හැකි ද?

ඔවුන්ගේ බලතල හා අධිකාරයන් පිළිබඳ පොලිස් නීතිය : 18 වගන්තිය



- අත්අඩංගුවට ගැනීම කරන නිලධාරියාගේ නම, ඔහුගේ පදවිය හා සේවා අංකය අත්අඩංගුවට ගනු ලබන තැනත්තාට පැවසිය යුතු ය.

- අත්අඩංගුවට ගැනීමේ දී අත්අඩංගුවට ගනු ලබන තැනත්තාට අත්අඩංගුවට ගන්නා කාරණය දැනුම් දිය යුතු යි

## මා පොලිස් අත්අඩංගුවේ තබා ගෙන සිටිය දී එකතු කරනුයේ කුමන තොරතුරු ද?

### පොදු පොලිස් නීති, 4 වන පරිච්ඡේදය : 28 වගන්තිය



- පෞද්ගලික ජීව දත්ත/විස්තර
- ඇඟිලි සලකුණු
- ඡායාරූප
- බර හා උස පරීක්ෂා කරනු ඇත
- බාහිර තුවාල කිසිවක් තිබේ නම් අත්අඩංගුවට ගනු ලැබූ තැනත්තා පොලිස් අත්අඩංගුවට ගනු ලබන විට වාර්තාගත කරනු ඇත.

## රඳවා ගනු ලැබ ඇති පුද්ගලයෙකුට සලකන්නේ/සන්දේශනය කරන්නේ කෙසේ ද?

### ව්‍යවස්ථාව : 57 වගන්තිය



- නීතිය මගින් සලසා ඇති පරිදි අත්අඩංගුවට ගැනීම හෝ රඳවා ගැනීම මගින්, අධිකරණ නියෝගයක මගින් හෝ සමාජ හේතූන් නිසා රාජ්‍ය රැකවරණය යටතේ රඳවා ගැනීම මගින් නිදහසට අහිමි කරන ලද සෑම අයෙකුටම මානුෂිකව හා මනුෂ්‍ය පුද්ගලයෙකුගේ සහජ ගරුත්වයට ගරු කිරීමෙන් යුතුව සැලකිය යුතු ය.

- පුද්ගලයෙකුට මෙම පරිච්ඡේදයෙහි විස්තර කර දක්වා ඇති අයිතීන් හෝ නිදහස අහිමි කළ හැක්කේ ඔහු ඔහුගේ නිදහසට අහිමි

කරනු ලැබීමේ කාර්යය සඳහා අවශ්‍ය කෙරන තාක් දුරට පමණ.



## මට අපරාධයක් කරන්නේ යයි චෝදනා කරනු ලැබුවේ නම් මගේ අයිතීන් වනුයේ මොනවා ද?

ව්‍යවස්ථාව : 51 වගන්තිය



- විශේෂිත වරද පිළිබඳව ප්‍රමාදයකින් තොරව චූදිත විසින් තේරුම් ගනු ලැබිය හැකි භාෂාවකින් දැනුවත් කරනු ලැබීමේ අයිතිය;

- සාධාරණ කාලයක් ඇතුළත නඩු විභාග කරනු ලැබීමේ අයිතිය;

- නඩු විභාගය පවත්වනු ලබන භාෂාව ඔහුට කතා කළ නො-හැකි විට හෝ ඔහු බිහිරි හෝ ගොළු නම් හෝ රජය විසින් පරිවර්තයෙකු ලබා දෙනු ලැබීමේ අයිතිය;

- ඔහුගේ චිත්ති වාචකය

පිළිබඳව සූදානම් වීම සඳහා හා ඔහුගේ තෝරා ගැනීම අනුව නීතිඥවරයෙකු සමග කතිකා කර ගැනීමට හා උපදෙස් ලබා දීමට ප්‍රමාණවත් කාලයක් හා පහසුකම් ලැබීමේ අයිතිය;

- නඩු විභාගයට තමන්ම පෙනී සිටීමේ හා ඔහුගේ තෝරා ගැනීම අනුව නීතිඥවරයෙකු  මගින් විත්ති වාචනය කිරීමේ අයිතිය;

- ඔහුට එරෙහි සාක්ෂිකරුවන් ප්‍රශ්න කිරීමේ හා සාක්ෂිකරුවන්ගේ පැමිණීම හා ප්‍රශ්න කිරීම් වාර්තා ලබා ගැනීමේ අයිතිය;

- සාධාරණ සැකයක් ඉක්මවා වරදකාරිත්වය ඔප්පු කරන තෙක් නිර්දෝෂී යයි පූර්වානුමාන කරනු ලැබීමේ අයිතිය;

## මා අත්අඩංගුවට ගනු ලැබුවේ හෝ රඳවා ගනු ලැබුවේ නම් මට නීතීඥවරයෙකුගේ සහාය ලබා ගත හැකි ද?

**ව්‍යවස්ථාව : 53 වගන්තිය**



- නීතිමය සහාය අවශ්‍ය වන ඕනෑම අවස්ථාවක දී සෑම අයෙකුටම නීතිඥවරයෙකුගේ සේවය ලබා ගැනීමේ හා උපදෙස් දීමේ අයිතිය ඇත්තේ ය.

- බරපතල අපරාධ නඩුවල දී නීතීඥවරයෙකු යෙදවීමට නොහැකි චූදිත පුද්ගලයෙකුට රජය (නීතිපති කාර්යාලය) නීතීඥවරයෙකු ලබා දිය යුතු ය.

## පොදු පොලිස් නීති, 6 වන පරිච්ඡේදය : 54 වගන්තිය

- සිදු කෙරෙමින් තිබෙන ප්‍රශ්න කිරීමක් හා පරීක්ෂණයක් සම්බන්ධයෙන් චූදිත පුද්ගලයෙකුගෙන් ප්‍රශ්න කිරීමට පරීක්ෂණයට පැය 18 පෙර ස්ථානය හා කාලය පිළිබඳව ඔහුගේ නීතීඥවරයාට දැනුම් දෙනු ලැබිය යුතු ය.
- එහෙත් අපරාධයේ දරුණුකමට අනුව පරීක්ෂණයට පැය 10 පෙර ස්ථානය හා කාලය පිළිබඳව නීතීඥවරයාට දැනුම් දෙනු ලැබිය යුතු ය.

**යම් වරදක් හෝ පැහැර හැරීමක් එය සිදු කරන ලද අවස්ථාවේ නීතිය යටතේ වරදක් සංස්ථාපනය නොවූ විට ඒ වරද හෝ පැහැර හැරීම සම්බන්ධයෙන් පුද්ගලයෙකු වරදකරුවෙකු කළ හැකි හැකි ද?**

## ව්‍යවස්ථාව : 59 වගන්තිය

ඉස්ලාමීය ශාරියා නීතිය යටතේ හෝ යම් වරදක් හෝ පැහැර හැරීමක් එය සිදු කරන ලද අවස්ථාවේ

- නීතිය යටතේ වරදක් සංස්ථාපනය නොවූ විට කිසිදු පුද්ගලයෙකු වරදකරුවෙකු නොකළ යුත්තේ ය.
- වරද සිදු කරන ලද අවස්ථාවෙහි දිය හැකි දඬුවමකට වඩා බරතල දඬුවමක් ද පැනවිය නොයුතු ය.
- වරදක් සඳහා වන දඬුවම සකරණ කාලය හා දඬුවම් නියම කිරීමේ කාලය අතරතුර අඩු කර තිබේ නම් චූදිත වඩා අඩු දඬුවමේ ප්‍රතිලාභය ලැබීමට හිමිකම් ලබය.

*For more Inbformation:*

*Human Rights Commission of the Maldives*

*Ma.Uthuru Vehi, 5th Floor, Keneree Magu, Male’*

*Tel: 3336539, 3329245, 3344977, 3304013*

*Fax: 3338658*

*Toll free Number: 1424*

*Email: info@hrcm.org.mv*

*Website: www.hrcm.org.mv*